# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1569 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 13/12/2023<br>පැය 2315 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. බෞද්ධ ආගමට නින්දා වන ආකාරයේ ප්‍රකාශ හා ක්‍රියා සිදුකළ චීවරධාරීයෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.**

හිමිනමක් විසින් බෞද්ධ ආගමට නින්දා වන ආකාරයේ සහ බෞද්ධ ආගමිකයන්ගේ හැඟීම් වලට රිදවීමක් ඇතිවන ආකාරයේ ප්‍රකාශයන් වීඩියෝ ගතකර අන්තර්ජාලයට මුදා හැරීම සම්බන්ධයෙන් අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන අංශයේ නිලධාරින් කණ්ඩායමක් විසින් විමර්ශන සිදුකර 2023.12.12 වන දින දහවල් කාලයේදී කලගෙඩිහේන ප්‍රදේශයේදී මෙම හිමිනම අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 34 ක් වන තිහාරිය, කලගෙඩිහේන ප්‍රදේශයේ පදිංචි චීවරධාරියෙකි.**

මෙම පුද්ගලයා විශ්ව බුද්ධිමුණි නොහොත් රත්නපුරේ විමල බුද්ධි හිමි ලෙස පෙනී සිටින බවට අනාවරණය වී ඇති අතර, බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක්ද යන්න සම්බන්ධයෙන් තහවුරු කර ගැනීම සඳහා විමර්ශන සිදුකරනු ලබයි. සැකකරු 2023.12.13 වන දින අලුත්කඩේ අංක 01 ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2023.12.19 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත. අපරාධ පරික්ෂණ දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. වංචනික ලෙස මුදල් රැස්කළ පුද්ගලයින් දෙදෙනෙකු අත්අඩංගුවට - නුවරඑළිය පොලිස් ස්ථානය.**

දරුවෙකුගේ ඡායාරූප හා වෛද්‍ය වාර්තා ප්‍රසිද්ධියේ පෙන්වමින් එම දරුවාට අසනීපයක් ඇති බවට සමාජයට හඟවා වංචනික ලෙස පුද්ගලයින් දෙදෙනෙකු විසින් නුවරඑළිය ප්‍රදේශයේ මුදල් එකතු කරන බවට දරුවාගේ පියා විසින් දඹාන පොලිස් ස්ථානයට පැමිණිල්ලක් සිදු කර ඇත.

ඒ සම්බන්ධව දඹාන පොලිස් ස්ථානය මගින් සිදු කරන ලද දැනුම් දීම අනුව 2023.12.12 වන දින දහවල් කාලයේ නුවරඑළිය බස් නැවතුම්පලේදී නුවරඑළිය පොලිස් ස්ථානයේ නිලධාරින් විසින් මෙසේ වංචනික ලෙස මහජනතාවගෙන් මුදල් රැස් කරමින් සිටි පුද්ගලයින් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 25 සහ 34 වයස් වල පසුවන මිදිගම හා අහංගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මෙම ආකාරයට මහජනතාවගෙන් එකතු කරන ලද රුපියල් 10,900/= ක මුදලක් සැකකරුවන් සන්තකයේ තිබී සොයාගෙන ඇති අතර, සැකකරුවන් විසින් මෙම දරුවාගේ අසනීප තත්ත්වයක් සඳහා නිකුත් කර තිබූ වෛද්‍ය වාර්තා ඇතුළු ලේඛණ වල ඡයා පිටපත් වංචනික ලෙස ලබාගෙන දරුවාගේ භාරකරුවන්ගේ දුරකථන අංක ලෙස සැකකරුවන්ගේ දුරකථන අංකයන් සඳහන් කරමින්, මහජනයා මුලා කර මුදල් රැස්කර ඇති බවට වැඩිදුර විමර්ශනයේ දී අනාවරණය වී ඇත. නුවරඑළිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**